# ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ මනෝ සමාජීය ගැටලු පිළිබඳ විමසුමක් (දකුණු වෙරළබඩ ප්‍රදේශයට අයත් හික්කඩුව සංචාරක පුරවරය ඇසුරෙන්)

එම්.එම්. අමිල බණ්ඩාර, කේ. හේෂාන් නිර්මල
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
amithbandara087@gmail.com

ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයන ප්‍රධාන සංරචකයක් ලෙස සංචාරක කර්මාන්තය හඳුන්වා දිය හැකිය. එකී කර්මාන්තයේ යාවජීව පැවැත්ම සඳහා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම ඒකාකාරී මැදිහත් වීමක් දක්නට ලැබේ. අප අධ්‍යයන ප්‍රදේශය වන හික්කඩුව සංචාරක පුරවරයට පැමිණෙන විදේශීය සංචාරකයින් හට මානසික මෙන් ම සමාජීය ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවන බව අධ්‍යනයේදි තහවුරු විය. ඒ අතර සංස්කෘතික බලපෑම, මත්ද්‍රව්‍ය භාවිතය සහ ඒවා ලබා ගන්නේ කෙසේද යන වග, නගර සින්ඩ්‍රෝමය (City Syndrome) සහ මුදල් හා බඩු භාණ්ඩ අස්ථානගතවීම, ආදිය සුලභව දැකීමට හැකි විය. ලංකාව තුල දක්නට ලැබෙන බහු සංස්කෘතියත් සමග විදේශකයින් වැඩි වශයෙන් මෙරටට පැමිණෙති. එහිදී ඔවුන් හට නගර සින්ඩ්‍රෝමය ඍජුව බලපානුව ලබයි. එය ඇතිවීමට බලපානු ලබන ප්‍රධානතම සාධකය වන්නේ නව පරිසර තත්ත්වයන් නිසා උද්දීපනය වන නැවුම් උද්වේගකර අදහස්ය. එහිදී තාවකාලිව උමතු බවක් පෙන්නුම් කරයි. එමෙන් ම සංස්කෘතික බලපෑම නිසාද මනෝ සමාජයීය ගැටලු රැසක් පැන නැගී ඇති බව පැහැදිලිව හඳුනාගැනීමට හැකි විය. භාෂාව, ආගම, ඇඳුම්-පැළඳුම්, කෑම-බීම, සිරිත්-විරිත් ඒ සඳහා ප්‍රධාන විය. ලංකාවේ මුදල් භාවිතය පිළිබඳ විදේශීය සංචාරකයින් තුළ පවතින අනවබෝධය වඩාත් කැපී පෙනුණේ වෙළෙඳපොළ සමග සිදු කරනු ලබන මුදල් හුවමාරු වලදීය. සංචාරකයින් සතු පෞද්ගලික බඩු භාණ්ඩ අස්ථානගත වීම හමුවේ ඔවුන් දැඩි මානසික අසීරුතාවයකට මුහුණ පාන බව ද හඳුනා ගැනීමට හැකි විය. මත්ද්‍රව්‍ය ප්‍රචලිතයත් සමග ඇතිවන මනෝ සමාජීය ගැටළු ද ප්‍රධාන තැනක් උසුලයි. එහිදී පුරුද්දක් වශයෙන් මෙන්ම පරිසරය වෙනස් වීමත් සමඟ මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හඳුනා ගැනීමට හැකිවිය. මත්ද්‍රව්‍ය භාවිතයෙන් පසු කලකෝලාහලවලට ගොදුරුවීම, ලිංගික අල්ලස් දීමට සිදුවීම, විවිධ චෝදනාවලට වැරදිකරුවන් වීම මේ තුළින් ගොඩනැගෙන අතුරු ප්‍රතිඵලයන්ය. පර්යේෂණයෙන් තහවුරු කරගත් මනෝ සමාජීය ගැටළු මුල්කරගනිමින් විදේශීය සංචාරකයින් තුළ අසාමාන්‍ය සැකය, බය, චකිතය, නුරුස්සන ස්වභාවය, භාවයන්වල ඉහළ පහළ යෑම, නින්ද නොයෑම, උදාසීන බව, ඔවුන් තුළින් හඳුනා ගැනීමට හැකි විය. මෙම ගැටලු තුළින් ඇතැම් ගැටලු ඇතිවීම ස්වභාවිකය. මෙම ගැටලු අවම කර ගැනීම සඳහා සංචාරක කර්මාන්තයට සම්බන්ධ බහු පාර්ශවයන්ගේම අන්තර් සම්බන්ධතාවය සහ ප්‍රජානනමය ලක්ෂණවල දියුණුව අත්‍යවශ්‍ය බව පෙන්වා දිය හැක.

**ප්‍රමුඛ පද:** මානසික ගැටලු; සමාජීය ගැටලු; සංචාරක කර්මාන්තය; සංචාරකයෝ; ශ්‍රී ලංකාව